සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 7 - 2017

**නම : ................................................ බුද්ධ ධර්මය කාලය : පැය 2යි.**

**සැලකිය යුතුයි:**

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් ලකුණු 40ක් හිමි වේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

## I කොටස

- **අංක 1 සිට 5 දක්වා ප්‍රකාශ හරිනම් ( 3 ) ලකුණ ද වැරදිනම් ( 8 ) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

(1) පංච සීලයට අයත් නොවන ශික්ෂාපද හතරක් ආජීව අෂ්ටමක සීලයෙහි සඳහන් වේ. ( )

(2) ශිෂ්‍යයන් විසින් ගුරුවරුන්ට යුතුකම් පහකින් සංග්‍රහ කළ යුතු වේ. ( )

(3) සාලිකේදාර ජාතකයෙන් නායකත්ව ලක්ෂණ පෙන්වා ඇත. ( )

(4) දුටුගැමුණු රජතුමා මිහිඳු මහරහතන් වහන්සේගෙන් උපදෙස් ලබාගෙන රාජ්‍ය පාලනය කළේය. ( )

(5) සෝණදණ්ඩ නම් උගත් බ්‍රාහ්මණයා බුදුරජාණන් වහන්සේගේ ගුණ ප්‍රකාශ කළ බමුණෙකි. ( )

- **අංක 6 සිට 10 දක්වා ඇති ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(6) මිච්ඡා ආජීවය යනු,

(i) දිවි පැවැත්ම වේ. (ii) හරි දිවිපැවැත්ම වේ.
(iii) හිස් වචනය වේ. (iv) වැරදි දිවිපෙවෙත වේ.

(7) සිගාලෝවාද සූත්‍රයේ සදිසාවට අනුව ගුරුවරුන් උපමා කර ඇති දිසාව වන්නේ,

(i) දකුණු දිසාව ය. (ii) නැගෙනහිර දිසාව ය.
(iii) උඩ දිසාව ය. (iv) උතුරු දිසාව ය.

(8) එක් අශිෂ්ට බමුණෙක් පිටුපසින් පැමිණ තද අතුල් පහරක් ගැසුවේ,

(i) මුගලන් තෙරුන්ට ය. (ii) අනඳ තෙරුන්ට ය.
(iii) සැරියුත් තෙරුන්ට ය. (iv) පුණ්ණ තෙරුන්ට ය.

(9) ''ගුරු සිත නොරිදවා......'' යන කවිය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

(i) කාව්‍යශේඛරයයි. (ii) බුදුගුණ අලංකාරයයි.
(iii) කව් සිළුමිණ යි. (iv) ලෝවැඩ සඟරාවයි.

(10) සන්නිපාතිකා ආබාධා යනු,

(i) වාතය කිපීමෙන් හටගන්නා ආබාධ වේ. (ii) අනුන්ගෙන් බෝවීමෙන් හටගන්නා ආබාධ වේ.
(iii) ඍතු විපර්යාස නිසා හටගන්නා ආබාධ වේ. (iv) වැරදි පුරුදු නිසා හටගන්නා ආබාධ වේ.

v අංක 11 සිට 15 දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

(11) වැඩිහිටියන්ට නිසි සැලකිලි දැක්විය යුතු ආකාරය දක්වා ඇත්තේ ........................................ ජාතකය මගින් ය.

(තිත්තිර/ මඛාදේව/ ස්වර්ණ හංස)

(12) රාත්‍රියේ සැතපීමට පෙර ........................................................ තෙරණුවෝ තම ගුරුවරයා වූ අස්සජි තෙරුන් වෙසෙන විහාරය දෙසට හැරී වැන්දෝ ය.

(අනඳ/සැරියුත්/පුණ්ණ)

(13) ගුණ ජාතක කතාව මගින් ........................................... අගය මනාව පෙන්වා දී ඇත.

(කළ ගුණ සැලකීමේ/ අධිෂ්ඨානයේ/ මෛත්‍රී කිරීමේ)

(14) උපයන ධනය සමාජ යහපතට හේතුවන අයුරින් වැය කළ යුතු ආකාරය පත්තකම්ම සූත්‍රයේ දැක්වෙන ...................... තුළින් පැහැදිලි වේ.

(බිලි පූජා/ පංච බලි/ බලි පූජා)

(15) උතුම් ඉවසීම අප මහා බෝසතාණන් ප්‍රගුණ කළ අයුරු ......................................... ජාතකයෙන් පැහැදිලි වේ.

(ක්ෂාන්තිවාදී/ නළපාණ/ අපණ්ණක)

v අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවල ''අ'' තීරුවට ගැළපෙන පිළිතුර ''ආ'' තීරුවෙන් තෝරා එහි අංකය වරහන තුළ යොදන්න.

| ''අ'' තීරුව | | ''ආ'' තීරුව |
|---|---|---|
| (16) සම්මා වායාම | (...........) | 1. පංචේන්ද්‍රිය පිනවීම |
| (17) කරණීයමෙත්ත සූත්‍රය | (...........) | 2. සෝපාක |
| (18) අසරණ සරණ ගුණය | (...........) | 3. අංගුලිමාල |
| (19) වැඩිහිටියන්ට සැලකීම | (...........) | 4. සමාධිය |
| (20) කාම තණ්හා | (...........) | 5. සුවචෝ |
| | | 6. වෘද්ධාපචායනය |

(ලකුණු 2 x 20 = 40 )

## II කොටස

v පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(1) (i) පංචසීලයෙහි සඳහන් නොවන ආජීව අෂ්ටමක සීලයට අයත් සිල්පද දෙකක් ලියන්න.
(ii) බුදුරජාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රය දේශනා කළේ කවුරුන් අරභයා ද?
(iii) ගුරුසිත නොරිදවා ...... යන පද්‍ය සම්පූර්ණ කරන්න.
(iv) චතුරාර්ය සත්‍ය ධර්මයෙන් දෙකක් නම් කරන්න.
(v) බෞද්ධයකු විසින් අත්හල යුතු අන්ත දෙක ලියන්න.
(vi) සම්මා දිට්ඨි යන වචනයෙහි අර්ථය සඳහන් කරන්න.
(vii) සුනාපරන්ත දේශයට භාවනා කිරීමට වැඩම කළ භික්ෂුව කවුද?
(viii) බුදුරජාණන් වහන්සේ රෝග හටගන්නා ක්‍රම අටක් දේශනා කල සූත්‍රය කුමක් ද?
(ix) අටලෝ දහමින් දෙකක් නම් කරන්න.
(x) බෞද්ධයාගේ අත්පොත යනුවෙන් හඳුන්වන ග්‍රන්ථයේ නම කුමක් ද?

(ලකුණු 2 x 10 = 20)

(2) (i) ගුරු ශිෂ්‍ය යුතුකම් සඳහන්වන සූත්‍ර දේශනාව කුමක් ද?
(ii) ගුරුවරයාගෙන් ශිෂ්‍යයාට ඉටුවන යුතුකම් තුනක් සඳහන් කරන්න.
(iii) ශිෂ්‍යයකු වශයෙන් ඔබ ගුරුවරයාට යුතුකම් ඉටු කිරීමෙන් ඔබට සැලසෙන යහපත පිළිබඳ වාක්‍ය පහක් ලියන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

(3) (i) නායකත්ව ලක්ෂණ ඇතුළත් පෙළපොතෙහි සඳහන් ජාතක කතාව ලියන්න.
(ii) එම ජාතක කතාවෙන් ගත හැකි නායකත්ව ලක්ෂණ තුනක් ලියන්න.
(iii) නායකත්ව ලක්ෂණ පෙන්නුම් කෙරෙන ජාතක කතාවක් කෙටියෙන් විස්තර කරන්න.(ලකුණු 2 + 3 + 5 = 10)

(4) (i) හෙළ බොදු සිරිත් දෙකක් නම් කරන්න.
(ii) ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.
(iii) භික්ෂූන් වහන්සේගේ නායකත්වය ප්‍රකට වන අවස්ථා පහක් ලියන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

(5) (i) නියාම ධර්ම දෙකක් සඳහන් කරන්න.
(ii) ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.
(iii) ඔබට කර්මය වෙනස් කළ හැකිය. එසේ වෙනස් කිරීමට ඔබ වර්ධනය කරගත යුතු ගුණ ධර්ම පහක් සඳහන් කරන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

(6) (i) ඉවසීම ප්‍රගුණ කළ බුද්ධ කාලීන තෙරුන් වහන්සේලා දෙනමක් නම් කරන්න.
(ii) ඉවසන දනා රුපු යුදයට ජය කොඩිය..... යන කවිය සම්පූර්ණ කරන්න.
(iii) ඔබ ඉවසීමෙන් ක්‍රියා කිරීමෙන් ඔබට ලැබුණු වාසි පහක් ලියන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

(7) (i) තස්සේව තේන පාපියෝ ....... ගාථාව සම්පූර්ණ කරන්න.
(ii) එම ගාථාවේ තේරුම ලියන්න.
(iii) බුදුරජාණන් වහන්සේ ඉවසීමෙන් ක්‍රියාකළ අවස්ථා පහක් ලියන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 7 - 2017

## බුද්ධ ධර්මය පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | - ( 4 ) | (6) | 4 | (11) | කිත්තිර ජාතකය | (16) | 4 |
| (2) | - ( 4 ) | (7) | 1 | (12) | සැරියුත් තෙරණුවෝ | (17) | 5 |
| (3) | - ( 8 ) | (8) | 3 | (13) | කළගුණ සැලකීම | (18) | 2 |
| (4) | - ( 8 ) | (9) | 1 | (14) | පංච බලි | (19) | 6 |
| (5) | - ( 4 ) | (10) | 2 | (15) | ක්ෂාන්තිවාදී ජාතකය | (20) | 1 |

(ලකුණු 2 x 20 = 40 )

### II කොටස

(1) (i) පිසුණාවාචා, පරුෂාවාචා, සම්පප්ප්‍රලාපා, මිච්ඡා ආජීවා
(ii) සිඟාලක නම් ගෘහපතියාට
(iii) ගුරුසිත නොරිදවා - වේලාව නොවරදවා
බැතිපෙම් උපදවා - අකුරු උගනී කුමරු සොඳවා
(iv) දුක්ඛ ආර්ය සත්‍යය/ දුක්ඛ සමුදය ආර්ය සත්‍යය/ දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය/ දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය/ සිංහලෙන් ලියා තිබුණ ද ලකුණු දෙන්න.
(v) අත්තකිලමතානුයෝගය/ කාමසුඛල්ලිකානුයෝගය
(vi) නිවැරදි දැකීම/යහපත් අවබෝධය/ චතුරාර්ය සත්‍යය පිළිබඳ ඥානය
(vii) ගිරිමානන්ද සූත්‍රය
(viii) පුණ්ණ තෙරුන්
(ix) ලාභ - අලාභ/ යස - අයස/ නින්දා - ප්‍රශංසා, සැප දුක
(x) ධම්ම පදය

(2) (i) සිගාලෝවාද සූත්‍රය
(ii) සිසුන් මැනවින් හික්මවීම/මැනවින් ඉගැන්වීම සියලු ශිල්ප ඉගැන්වීම/යහළු මිත්‍රාදීන්ට හඳුන්වාදීම/ රැකවරණය සැලසීම
(iii) ශිෂ්‍යයාගේ පිළිතුරු සළකා බලා ලකුණු දෙන්න.

(3) (i) අපණ්ණක ජාතකය
(ii) දුර දක්නා නුවණින් යුක්ත වීම/පූර්ව සූදානම හා සැලසුම් සහගත බව/ඉවසිලිමත් බව හා විමසිලිමත් බව/නිවැරදි තීරණ ගැනීම
(iii) අදාළ ජාතක කතාවක් ලියා තිබේ නම් ලකුණු දෙන්න.

(4) (i) වැඩිහිටියන්ට සැලකීම/ කළගුණ සැලකීම/ ආගන්තුක සත්කාරය/ අග්‍රශ්‍රෂ්‍ය දානය/ භික්ෂු නායකත්වය
(ii) ශිෂ්‍ය පිළිතුරු සළකා ලකුණු දෙන්න.
(iii) අදාළ කරුණු ලියා තිබේ නම් ලකුණු දෙන්න.

(5) (i) උතු නියාම/ බීජ නියාම/ චිත්ත නියාම/ ධම්ම නියාම/ කම්ම නියාම
(ii) අදාලව විස්තරයක් තිබේනම් ලකුණු දෙන්න.
(iii) ශිෂ්‍ය පිළිතුර සලකා බලා ලකුණු දෙන්න.

(6) (i) පුණ්ණ තෙරුන්/සැරියුත් තෙරුන් ආදී ලෙස ගත හැකිය.
(ii) ඉවසන දනා රුපු යුදයට ජය කොඩිය
මහමෙර උසුලනා මිහිකතටත් වැඩිය
ලොව සැම දෙනාගෙන් ඔහු උතුමෙකි වැඩිය
යළි ඒ සුදන සැප සේ සුර පුර වැඩිය
(iii) සමස්ත පිළිතුරු බලා ලකුණු දෙන්න.

(7) (i) තස්සේව තේන පාපියෝ
යෝ කුද්ධං පටිකුජ්ඣති
කුද්ධං අප්පටිකුජ්ඣති
සංගාමං ජෝති දුජ්ජයං
(ii) යමෙක් කෝධ කරන පුද්ගලයාට පෙරලා ක්‍රෝධ කෙරේ නම් ඔහු පළමු කිපුණු පාපි පුද්ගලයාටද වඩා පාපියෙක් වෙයි. කිපුණු තැනැත්තාට පෙරලා නොකිපෙන දිනීමට දුෂ්කර වූ ක්‍රෝධ සංග්‍රාමයෙන් දිනන්නෙක් වන්නේ ය.
(iii) ශිෂ්‍යයාගේ පිළිතුර සලකා බලා ලකුණු දෙන්න.